**සැලසිනේ රූපවාහිනී ආයතනය - 2020**

----------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

--------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------------

සැලසිනේ රූපවාහිනී ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

--------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් දැනටමත් භාවිතා කරමින් පවතින පිරිවැය රු.27,557,656 ක් වූ දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත 7 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණු අතර මෙම වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුගත කාලය ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර.3 ප්‍රකාරව නැවත ගළපා මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව, ඉදිරි වර්ෂයේදී දේපළ පිරියත හා උපකරණ සම්බන්ධයෙන් කටයුතු කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳ වූ ඇස්තමේන්තු ගත කාලය ප්‍රමිත ප්‍රකාරව නැවත ගලපා මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට ක්‍රියා කළ යුතු බව. |

### 1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂ | 300,440,528 | 279,538,783 | 20,901,745 | අදාල උපලේඛන ඉදිරිපත් කරමි. | මූල්‍ය ප්‍රකාශනයේ ශේෂයන්ට අදාලව විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කළ යුතු බව. |

| | | | | | |
|---|---|---|---|---|---|
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂ | 234,628,323 | 184,491,960 | 50,136,397 | උපලේඛනය ඉදිරිපත් කරමි. | මූල්‍ය ප්‍රකාශනයේ ශේෂයන්ට අදාලව විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කළ යුතු බව. |
| ගෙවිය යුතු ගොඩනැඟිලි කුලි (ජාතික චිත්‍රපට සංස්ථාව) | 900,000 | 4,106,000 | 3,206,000 | නිරවුල් කිරීමට කඩිනමින් කටයුතු කරනු ලබයි | අදාල ගෙවිය යුතු කුලි තහවුරු කර දැක්විය යුතු බව |

**1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| වෙළඳ ණයගැති ශේෂය | 288,956,004 | ශේෂ සනාථ කිරීම් | ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් කර ඇත. | ගිණුමේ දැක්වෙන වටිනාකමට අදාලව ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් කළ යුතු බව. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ | | | |
| | (i) මුදල් රෙගුලාසි 134 | සමාලෝචිත වර්ෂයට අදාලව අභ්‍යන්තර විගණන වැඩසටහනක් පිළියෙල කර නොතිබුණු අතර අභ්‍යන්තර විගණන වාර්තාද විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කළ යුතු බව සහ අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට ක්‍රියා කළ යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 757 | ගිණුම් වර්ෂය අවසානයේ භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ ක්‍රියාකර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ වාර්තා නියමිත පරිදි ඉදිරිපත් කළ යුතු බව. |
| (iii) | මුදල් රෙගුලාසි 371(2) (ආ) සහ 2020 අගෝස්තු 28 දිනැති අංක PFD/RED/01/01/2020/01 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය | කිසියම් විශේෂිත කාර්යයක් සඳහා ලබාදෙන තත්කාර්ය අතුරු අග්‍රිමය එක් අවස්ථාවකදි 100,000 නොඉක්මවිය යුතු වුවත් සීමාව ඉක්මවීම වැළැක්වීම සඳහා එක් නිශ්චිත කාර්යයක විවිධ කොටස් සඳහා වෙන වෙනම අත්තිකාරම් ලබා දී තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | සීමාව ඇතුළත අත්තිකාරම් ලබා දී නිරවුල් කර ගැනීමට ක්‍රියා කළ යුතු බව. |
| | | තවද, ලබාගත් අත්තිකාරම් මුදල අදාල කාර්යය නිමවූ වහාම පියවීමට කටයුතු කළ යුතු වුවත් 2013 සහ 2014 යන වර්ෂවලදී නිලධාරියෙකුට ලබා දී තිබුණු එකතුව රු.312,400 ක් වූ අත්තිකාරම් මුදල්ද 2020 නොවැම්බර් 16 වන දින ලබා දී තිබු රු.53,620 ක් වූ අත්තිකාරම් මුදලක්ද මෙම වාර්තාවේ දිනය වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | අදාල කාර්යය නිමවූ වහාම අත්තිකාරම් මුදල් නිරවුල් කිරීමට ක්‍රියා කළ යුතු බව. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.1 වගන්තිය | එක් එක් වර්ෂයට අදාල ආදායම් අතිරික්තය භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල රු.240,437,840 ක | අදහස් දක්වා නොතිබුණි. | අතිරික්ත ආදායම භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට ක්‍රියා කළ යුතු බව. |

| | | |
|---|---|---|
| ආදායම සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | | |

**1.7 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 24 දරන දේශිය ආදායම් පනතේ 2(1) (අ) වගන්තිය ප්‍රකාරව යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අය කළ හැකි ආදායමක් ලබන තැනැත්තෙකු විසින් එක් එක් තක්සේරු වර්ෂය සඳහා ආදායම් බද්ද ගෙවනු ලැබිය යුතු වුවත් 1982 ,පෙබරවාරි 01 දින ආරම්භ කර තිබූ සැලසිනේ රූපවාහිනී ආයතනය විසින් මෙම වාර්තාවේ දිනය වන විටත් ආදායම් බදු ගෙවීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ආදායම් බදු ගෙවීමට ක්‍රියා කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 29,339,593 ක පාඩුවක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ ලාභය රු. 8,300,209 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.37,639,802 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආදායම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ සෘජු ආදායම් සියයට 63 කින්ද වෙනත් ආදායම් සියයට 15 කින්ද අඩු වී තිබූ අතර මුළු ආදායමේ අඩු වීම සියයට 62 ක් විය. එමෙන්ම සෘජු වියදම් සියයට 64 කින්ද අනෙකුත් වියදම් සියයට 19 කින්ද අඩු වී තිබූ අතර මුළු වියදමේ අඩු වීම සියයට 57 ක් විය.

### 2.3 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය සියයට 3.5 කින් අඩු වී තිබූ අතර ශුද්ධ ලාභ අනුපාතිය සියයට 453 කින් අඩු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සැලසිනේ රූපවාහිනී ආයතනය, 2020 ඔක්තෝබර් 19 දිනැති අංක අමප/20/1572/316/009 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පෞද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමට තීරණය කර තිබුණද එම කටයුතු ද, ඊට අදාලව ආයතනයට ලේකම්වරයෙක් පත්කර ගැනීමේ කටයුතුද මෙම වාර්තාවේ දිනය වන විටත් අවසන් කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ලේකම්වරයෙකු පත්කර ගැනීමේ සහ සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කළ යුතු බව. |
| (ආ) | 2016 සිට 2020 වර්ෂය දක්වා ආයතනය වෙත ඉදිරිපත් කර තිබූ විගණන විමසුම් 09 ක් සඳහා විගණිත මෙම වාර්තාවේ දින වන විටත් පිළිතුරු ලබා දී නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු ලබා දිය යුතු බව. |
| (ඇ) | 2016 වර්ෂයට පෙර සිට පැවත එන රු 11,988,000.ක මූල්‍ය වංචාවට අදාල අලාභය අයකර ගැනීමට මෙම වාර්තාවේ දිනය වනවිටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2016 වර්ෂයට පෙර සිට පැවත එන රු.11,988,000 ක මූල්‍ය වංචාවට අදාල නීතිමය ක්‍රියාමාර්ග වශයෙන් මහාධිකරණයේ මේ වනවිට නඩු කටයුත්තක් විභාග වෙමින් පවති. | වංචාවට අදාල අලාභය අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු බව. |

### 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2010 අගෝස්තු 12 දිනැති අංක 10/1682/407/014 දරණ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රාජ්‍ය ආයතනවල දැන්වීම් හා ප්‍රචාරණ කටයුතු සැලසිනේ රූපවාහිනී ආයතනය මඟින් ඉටුකරවා ගැනීමේ බලය ලැබී වසර 10 ක් ගතව තිබුණත් ඒ සඳහා | අදහස් දක්වා නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | අවශ්‍ය මානව හා භෞතික සම්පත් අවශ්‍යතා සපුරා ගැනීමට කළමණාකරනය විසින් ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි. | | |
| (ආ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ 9.8 අනුව, ප්‍රසම්පාදන කමිටුවේ එකඟත්වය අනුව විද්‍යුත් මාධ්‍යයෙන් ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක කළ හැකි වුවද අදාල එකඟත්වයෙන් තොරව විද්‍යුත් ප්‍රසම්පාදනය ක්‍රියාත්මක කර තිබුණු අතර සැපයුම්කරුවන්ගෙන් ඉතා අල්ප ප්‍රතිචාර ලැබී තිබීම හේතුවෙන් තරඟකාරීත්වයකින් තොරව සැපයුම්කරුවන් තෝරා ගෙන තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතු බව. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

---

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 70 දෙනෙකු වූ අතර ඉන් 31 දෙනෙකු ස්ථිර සේවකයින්ද 39 දෙනෙකු කොන්ත්‍රාත් පදනමින් බඳවාගත් සේවකයින්ද විය. එදිනට තත්‍ය කාර්ය මණ්ඩලය 54 ක් වූ අතර ඉන් 14 දෙනෙකු ස්ථිර සේවකයින්ද, අනෙක් නිලධාරීන් 40 කොන්ත්‍රාත් පදනමින් බඳවාගත් අය විය. මේ අනුව ස්ථිර කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 17 ක් පැවති අතර කොන්ත්‍රාත් පදනමින් බඳවා ගත් නිලධාරියෙක් අතිරේකව සේවයේ යොදවා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | කාර්ය මණ්ඩලය අනුමත ආකාරයට බඳවා ගත යුතු බව. |
| (ආ) | 2014 ඔක්තෝබර් 15 දිනැති අංක DMS/1595 දරන කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ලිපිය මඟින් ,කොන්ත්‍රාත් පදනම මත තනතුරු 18ක් අනුමත කර ඊට අදාල බඳවා ගැනීමේ පරිපාටි සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු බව සඳහන් කර තිබුණද කළමණාකරු (මූල්‍ය) තනතුර හැර | අදහස් දක්වා නොතිබුණි. | බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කරගෙන ඒ අනුව බඳවා ගැනීම් සිදු කළ යුතු බව. |

අනෙකුත් තනතුරුවලට අදාලව බඳවා ගැනීමේ පරිපාටි අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12/දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1වගන්තිය ප්‍රකාරව ,ආයතනයේ සමාලෝචිත වර්ෂයට අදාල කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන ,මූල්‍ය වර්ෂය අවසාන වී දින 60ක් ඇතුළත රේඛීය අමාත්‍යාංශයට සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට පිටපත් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් දින 100 ක් ප්‍රමාද වී 2022 ජූනි 09 දින ඉදිරිපත් කර තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | කෙටුම්පත් වාර්ෂික වාර්තාව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත ආදාල ආයතනය වෙත ඉදිරිපත් කිරීමට ක්‍රියා කළ යුතු බව. |

### 4.2 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී / 12දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව 2017,2018 සහ 2019 වර්ෂවල වාර්ෂික වාර්තා මෙම වාර්තාවේ දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | වාර්ෂික වාර්තා නොපමාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුය. |

### 4.3 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති හා අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය ප්‍රකාරව, සමාගමේ දර්ශනය හා මෙහෙවර ඉටු කර ගැනීම සඳහා වර්ෂ තුනකට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් හා ඊට | අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

අනුරූපව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාලව සංයුක්ත සැලැස්මක් පිළියෙල කිරීමෙන් තොරව ක්‍රියාකාරී සැලැස්මක් පමණක් පිළියෙල කර තිබුණි.

**4.4** වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉසව් කළමණාකරනය, ගැෆික් හා මුද්‍රණ ආදායම් ඉපැයීම, නිෂ්පාදන ආදායම් ඉපැයීම හා උපලේඛනගත ආදායම් ඉපැයීම යන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සම්බන්ධ භෞතික කාර්යසාධනය සියයට 15 සිට සියයට 59 දක්වාද මූල්‍ය කාර්යසාධනය සියයට 10 සිට සියයට 41 දක්වාද අවම මට්ටමක පැවතුණි. | අදහස් දක්වා නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යසාධනය ලබා ගත යුතු බව. |
| (ආ) | නව ගැනුම්කරුවන් සොයාගැනීමේ ඉලක්කය ගැනුම්කරුවන් 80 ක් වුවද 2020 වර්ෂය තුල ගැනුම්කරුවන් 16 ක් එනම් 20% ක ඉලක්කයක් පමණක් සපුරා ගෙන තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | සැලැස්මට අනුව ඉලක්ක ළඟා කර ගත යුතු බව. |

**4.5** තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 'තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතින්ගේ වසර 2030 න්‍යාය පත්‍රය' ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන් සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු ,ඉලක්ක හා එම ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගෙන නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ඒ අනුව කටයුතු කළ යුතු බව. |